**අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018**
**ඉතිහාසය 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

## <u>I පත්‍රය</u>


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 1 | 21. | 2 | 31. | 3 |
| 2. | 3 | 12. | 3 | 22. | 3 | 32. | 2 |
| 3. | 4 | 13. | 4 | 23. | 1 | 33. | 3 |
| 4. | 1 | 14. | 4 | 24. | 4 | 34. | 4 |
| 5. | 1 | 15. | 2 | 25. | 2 | 35. | 2 |
| 6. | 2 | 16. | 1 | 26. | 4 | 36. | 1 |
| 7. | 3 | 17. | 2 | 27. | 3 | 37. | 1 |
| 8. | 4 | 18. | 1 | 28. | 1 | 38. | 2 |
| 9. | 2 | 19. | 3 | 29. | 2 | 39. | 3 |
| 10. | 3 | 20. | 4 | 30. | 1 | 40. | 4 |

(ලකුණු 2 x 40 = 80)


## <u>II පත්‍රය</u>

**I කොටස**

01.(අ)




(ලකුණු 12)




(ලකුණු 1x6 = 06)

(ආ) (i) A - පැරණි ප්‍රාදේශීය මායිම්/ එකල පැවති මාර්ග සංඥා
B - නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා
C - රොබට් බැක්වෙල්
D - ජෝර්ජ් ග්‍රැන්විල්
(ලකුණු 1x4 = 04)

(ii) 1. දේව දරුවන් දෙදෙනා
2. මයිකල් ආන්ජලෝ
3. පුනරුද යුගයට
4. සිස්ටයින් දෙව් මැඳුර
(ලකුණු 1x4 = 04)

(iii) 1. එක්සත් ජාතීන්ගේ ප්‍රධාන අධිකරණය/ ජාත්‍යන්තර අධිකරණය/ අන්තර් ජාතික අධිකරණය.
2. නෙදර්ලන්තයේ හේග් නගරයේ.
3. සාමාජික රටවල අධිකරණ ක්ෂේත්‍රයේ ඉහළම තනතුරු දැරුවන් හා අන්තර් ජාතික නීතිය පිළිබඳව විශේෂඥයන් අතරින් විනිශ්චයකරුවන් තෝරා ගැනීම.
4. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විවිධ ආයතන වලට අවශ්‍ය නීති උපදෙස් ලබා දීම.
(ලකුණු 1x4 = 04)

## II කොටස

02. (i) A - සීගිරියේ පොතාන, සීගිරියේ අලිගල
B - පාහියන්ගල/ බටදොඹ ලෙන/ කිතුල්ගල බෙලිලෙන
(ලකුණු 1x3 = 03)

(ii) A - ඉබ්බන්කටුව/ ගල් සොහොන් කනත්ත/ යටිගල්පොත්ත
B - හල්දුම්මුල්ල/ බෙරගල
(ලකුණු 1x4 = 04)

(iii) භූ භෞතික පසුබිම - වාර්ෂික වර්ෂාපතන අගය, පසේ ස්වභාවය, භූ විෂමතාවය, ස්වභාවික සම්පත් වල ව්‍යාප්තිය, ජල වහනය
(කරුණු නම් කිරීමට ලකුණු 02, විස්තරයට ලකුණු 03)
(මුළු ලකුණු 05)

(iv)
- වෘත්තීන් අනුව ගම් පැවතීම (කසීකාරගාම, කේවට්ට ගාම)
- විවිධ කාර්යයන්ට අනුව ගම් පැවතීම (පටුන්ගම, නියම් ගම්)
- විවිධ ස්වභාවයන්ට අනුව ගම් පැවතීම (ඔලගම්, පනික්බිත්ත ගම්)
- වැව් කේන්ද්‍ර කොට ගෙන ගම් පැවතීම (වාපි ගම්)
- නාගරික ජනාවාස පැවතීම

(කරුණු සඳහා ලකුණු 03, විස්තරයට ලකුණු 03)
(මුළු ලකුණු 06)

03. (i) (A) - අයෝනියන්වරු (B) - කාම්බෝජවරු (C) - ජාවකවරු (ලකුණු 1x3 = 03)

(ii) (A) - ඇඹුල් අඹේ සෙල්ලිපිය
(B) - කළුදිය පොකුණ සෙල්ලිපිය
(C) - බෝවත්තේගල සෙල්ලිපිය
(D) - නැට්ටුක් කන්ද සෙල්ලිපිය
(ලකුණු 1x4 = 04)

(iii) i. ගුරු වෘත්තිය:- පුරාණ කාලයේ ශ්‍රී ලංකාවේ පැවති එක් වෘත්තියකි. ගුරු වෘත්තිය 'ආචාර්‍ය' යනුවෙන් හැඳින්වේ. ශිල්ප ඉගැන්වූ අය පමණක් නොව ශිල්ප ශාස්ත්‍ර වල නිපුණ වූවන් ද ආචාර්ය යනුවෙන් හැඳින්වේ.
උදා:- ඇතුන් හීලෑ කිරීමට දක්ෂ අය (හස්ති ආචාර්ය), අශ්වයන් පිට යාම පුරුදු කළ අය (අශ්ව ආචාර්ය), විත්තෙන් විදීමට පුහුණු කළ අය (දුනු ආචාර්ය) පිළිබඳ තොරතුරු සෙල්ලිපි වල සඳහන් වේ.

ii. වෛද්‍ය වෘත්තිය:- වෛද්‍යවරුන් වෙජ යනුවෙන් සෙල්ලිපිවල හඳුන්වා තිබේ. ක්‍රි.ව. 9 වන සියවසේ දී ඇතැම් වෛද්‍යවරු 'මහවෙදනා' නමින් හැඳින්වීම.

iii. නීති විශාරදයින්:- යුක්තිය පසිඳලීම සඳහා රජුට උපදෙස් දීම.''වොහොර'' යනුවෙන් හැඳින්වේ. තත්කාලීන සමාජයේ යුක්තිගරුක යහපත් දේ යැයි සම්මත ව්‍යවහාර සම්බන්ධයෙන් ප්‍රවීණත්වයක් මෙම පුද්ගලයන්ට හිමි වීම.

iv. විවිධ ශිල්පීන්:- නැට්ටුවන්, චිත්‍ර ශිල්පීන් (චිත්‍ර කර/ලපන) ඉතා දක්ෂ කවි නිර්මාණකරුවන් එකල සිටි බව සෙල්ලිපිවල සඳහන් වේ. (නම් කිරීමට ලකුණු 02, විස්තරයට ලකුණු 03) (ලකුණු 05)

(iv) රාජ්‍ය පාලනයට පවා දක්ෂ කාන්තාවන් සිටි බව සෙල්ලිපි වලින් තහවුරු වීම, ලීලාවතී රැජිණ තෙවරක්ම රට පාලනය කිරීම, චූල සීවලි නම් මහ රැජිණක් පිළිබඳ ලාහුගල නිල්ගිරිසෑය අසලින් හමුවූ සෙල්ලිපියක සඳහන් වීම, යුගලා බිසව යටතේ රුහුණෙහි පාලනය

- මව්වරුන් වශයෙන් වගකීම් ඉසිලීම නිසා කාන්තාවට ගෞරවාදරය හිමි වීම
- සූප ශාස්ත්‍රයෙහි දක්ෂ කාන්තාවන් 'මධුපාචිකා' යන ගෞරව නාමයෙන් හැඳින්වීම
- ප්‍රාදේශීය පාලිකාවන් ලෙස කටයුතු කරන ලද කාන්තාවන් පිළිබඳ සෙල්ලිපිවල සඳහන් වීම
- බෞද්ධ විහාරාරාම සඳහා දේපළ පූජා කළ කාන්තාවන් පිළිබඳ මූලාශ්‍ර වල සඳහන් වීම.

(උදාහරණ 03ට ලකුණු 03, විස්තරයට ලකුණු 03)
(ලකුණු 06)

04. (i) A - මින්නේරිය වැව/ හුරුළු වැව/ කවුඩුල්ල වැව/ කලා වැව/ යෝධ වැව/ මහ කනදරා වැව
B - පරාක්‍රම සමුද්‍රය (ලකුණු 1x3 = 03)

(ii) A - ගාවුත කණු B - ස්ඵීතික ජල විද්‍යා මූලධර්ම
C - වජ්‍ර චුම්භබට D - දිය කැට පහන (ලකුණු 1x4 = 04)

(iii)
- ලෝහ කර්මාන්තයේ නිරත ශිල්පීන් සිටීම
  යකඩ වැඩ කළ කම්මල් කරුවන් කඹර නමින් හැඳින්වීම.
- දෛනික වශයෙන් වැඩ කටයුතු වලට අවශ්‍ය කැත්ත, උදැල්ල, නගුල වැනි උපකරණ කම්හල්කරුවන් විසින් සකස් කර දීම.
- තඹ ලෝහයෙන් හා ටින් ලෝහයෙන් කර්මාන්ත කළ ශිල්පීන් සිටීම (තඹකර)
- රන් කරුවන් සිටි බව තුලාධර, ස්වර්ණකර යන නම් වලින් හැඳින්වේ.
- මැණික් සහ අර්ධ මැණික් වලින් නිම කරන ලද පබළු, මුද්‍රා ආදිදේ මෙකළ සමාජයේ දක්නට ලැබීම
- ඇත්දත් කැටයම් කලාව වේගිරිය දේවාලය අසල සෙල්ලිපියක සඳහන් වේ.
- මැටි කර්මාන්තය, නූල් කැටීම(තතවය) වෙහෙරකෙම සෙල්ලිපියේ සඳහන් වේ. මෙම සියළුම ශිල්පීන් එකල සමාජය හොඳින් පවත්වා ගෙන යාමට තමන්ගේ දැනුමෙන් සහ ශ්‍රමයෙන් ඉතා අගනා මෙහෙයක් ඉටු කරනු ලැබීම. (කරුණු නම් කිරීමට ලකුණු 02, විස්තරයට ලකුණු 03)

(ලකුණු 05)

(iv) පරිසරය ආරක්ෂා කිරීම සඳහා අතීත රජවරු විසින් විවිධ නීති පැනවීම.

1. IV වන මිහිඳු රජුගේ අනුරාධපුර පුවරු ලිපිය :- උස් ගොඩ ඉඩම් වල කැලෑ නොකැපිය යුතු බවට නියෝග කිරීම , පාංශු ඛාදනය, නායයාම් සිදු වන බව දන්වා සිටීම
2. IV වන මිහිඳු රජුගේ අනුරාධපුර වෙස්සගිරි සෙල්ලිපිය :- වැව් ජලයෙන් ගොවිතැන් කරන කුඹුරු වල සිහිනැටි වී මිස මුං ඇට වැපිරීම නොකළ යුතු බවට නියෝග කිරීම
3. V වන කාශ්‍යප රජුගේ කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය :- නිසි කලට සී සෑම නොකරන පුද්ගලයන්ගෙන් කලං පහක දඩයක්අය කිරීම,ගස් කොළන් කළමණාකරණයේ දී රජය පනවා ඇති නීති රීති වලට අනුකූලව ක්‍රියා කළ යුතු පවට රජයේ නිලධාරීන්ට උපදෙස් දී තිබීම
4. IV වන උදය රජුගේ අනුරාධපුර බුද්දන්නෙහෙල සෙල්ලිපිය

(උදාහරණ 03ට ලකුණු 03, විස්තරයට ලකුණු 03)
(ලකුණු 06)

05. (i) (A) - බඩගරික (B) - පණ අදෙක (C) නගර වුඩික (ලකුණු 1x3 = 03)

(ii) (A) - නිශ්ශංක අලගක්කෝණාර (B) - සුභ සෙන්පති (ලකුණු 1x4 = 04)
(C) - බුවනෛකබාහු ආදිපාද (D) - සංඛ සෙනවි

(iii)
- වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට යටත් කර ගැනීම
- උඩරට සාමාන්ත පාලකයා වූ ජෝතිය සිටුවරයා ඇති කළ කැරැල්ල මැඩලීම(අම්බුළුගල කුමරු යවා)
- අවසාන වරට රට එක් සේසත්කළ පාලකයා වීම
- අච්චිරාරාම පටුන ආක්‍රමණය කිරීම
- යාපනය ජය ගැනීම (සපුමල් කුමරු යවා)
- විජයනගර් අධිරාජ්‍යයේ තොටුපලක් ආක්‍රමණය කිරීම

(කරුණු 02කට ලකුණු 02, විස්තරයට ලකුණු 03)(ලකුණු 05)

(iv) • සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස කෝට්ටේ යුගය හැඳින්විය හැකිය. හයවන පැරකුම්බා රාජ්‍ය සමය සාහිත්‍යයට අගනා සේවයක් ඉටු කළ කාල පරිච්ඡේදයකි.
• හයවන පැරකුම්බා රජු ශ්‍රේෂ්ඨ නරපතියකුසේම උගත් පඬිරුවනකි. මෙකළ සාහිත්‍යයේ දියුණුවට සේවය කළ උගත් පැවිදි පඬිවරු රාශියක් සාහිත්‍යකරණයේ නිරත වීම.
• තොටගමුවේ රාහුල හිමි, වැත්තැවේ හිමි, වීදාගම මෛත්‍රී හිමි,ඉරුගල් කුලතිලක හිමි,එමෙන්ම නන්නූර්තුනය, රාමචන්ද්‍ර භාරති වැදගත් වීම.
• පැරකුම්බා සිරිත, කාව්‍යශේඛරය, බුදුගුණාලංකාරය, ලෝවැඩ සඟරාව, ගුත්තිල කාව්‍යය, හංස, ගිරා, පරෙවි, සැළලිහිණි ආදී සංදේශ කාව්‍යය බිහි වීම, භක්ති කාව්‍යය ශිලෝ කාව්‍යය, හටන් කාව්‍යය, ප්‍රශස්ති කාව්‍යය, උපදේශ කාව්‍යය කෝෂ ග්‍රන්ථ යනාදී කෘති රචනා වීම
• ඉදිවූ පිරිවෙන් පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙන, කැරගල පද්මාවතී පිරිවෙන, දෙවිනුවර ඉරුගල් කුලතිලක පිරිවෙන, වීදාගම සනාතනන්ද පිරිවෙන, ආදී බෞද්ධ මධ්‍යස්ථාන සාහිත්‍යයේ දියුණුවට අතිමහත් සේවාවක් කළ විද්‍යා ස්ථානයන්ය. (උදාහරණ 03ට ලකුණු 03, විස්තරයට ලකුණු 03 - 06)

06. (i) A - වීර සුන්දර බණ්ඩාර B - II වන රාජසිංහ රජු C - කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ලකුණු 1x3 = 03)

(ii) • කැළි කෝලාහල පිළිබඳ නඩු
• රාජ ද්‍රෝහිත්වය පිළිබඳ නඩු
• විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු
• වැදගත් නායකයින් සම්බන්ධ නඩු
• කුමන්ත්‍රණ පිළිබඳ නඩු (ලකුණු 1x4 = 04)

(iii) • 1594 පෘතුගීසි කපිතාන් පේරෝ ලෝපේස් ද සූසා යටතේ ආක්‍රමණයක් දියත් කර කරලියද්දේ බණ්ඩාර රජුගේ දියණිය වූ කුසුමාසන දේවිය හෙවත් දෝන කතිරිනා උඩරට රැජිණ වශයෙන් පෘතුගීසින් විසින් පත් කිරීම
• 1602 දී දොන් ජෙරනිමෝ ද අසවේදු යටතේ උඩරටට සේනාවක් එවීම හා පළමු වන විමල ධර්මසූරිය අතින් පරාජයට පත්වීම.
• 1630 දී කොන්ස්තන්තිනුදසා යටතේ උඩරටට සේනාවත් එවීම හා රන්දෙණිවල දී සෙනරත් රජුගේ පුත් මහා අස්තාන කුමරු අතින් එම සේනාව පරාජයට පත් වීම
• 1638 දී දියෝගෝද මෙලෝ කැස්ත්‍රෝ යටතේ එවන ලද හමුදාව II වන රාජසිංහ රජු විසින් ගන්නෝරුවේදී පරාජයට පත් කිරීම (අවස්ථා 02ට ලකුණු 02, විස්තරයට ලකුණු 03 - 05)

(iv) උඩරට රජු වෙනත් විදේශීය ජාතියක් සමඟ වෙළඳ සබඳතා පැවැත්වීම ලන්දේසීන් විසින් අවහිර කිරීම. රජු සමඟ මත භේද ඇතිවූ විට උඩරට හා පහතරට කඩවත් වසා දැමීම, පහතරට ඇතැම් ප්‍රදේශ වල වී වගාව දියුණු කිරීමට පියවර ගැනීම, උක්,කෝපි හා කපු වගා කිරීමට පියවර ගැනීම
(නම් කිරීමට ලකුණු 02, විස්තරයට ලකුණු 07 - 09)

07. (i) A - ඒ.ඊ. ගුණසිංහ මයා B - ආචාර්ය එන්.එම්. පෙරේරා C - ජී.ජී. පොන්නම්බලම්
(ලකුණු 1x3 = 03)

(ii) • ලංකාව නමින් හැඳින්වූ මෙරට ශ්‍රී ලංකාව නමින් හැඳින් වීම.
• මහා බ්‍රිතාන්‍ය සමඟ පැවැත් වූ ව්‍යවස්ථානුකූල බැඳීම් අවසන් කිරීම.
• ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස පිළි ගැනීම.
• මහජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම. (ලකුණු 1x4 = 04)

(iii) • යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම.
• රාජ්‍ය උත්සව වල මුලසුන ගැනීම.
• ජාත්‍යන්තර වශයෙන් ජන රජය නියෝජනය කිරීම.
• රාජ්‍ය මුද්‍රාව තබා ගැනීම.
• නම්බුනාම පිරිනැමීම, තානාපතිවරු පිළි ගැනීම හා පත් කිරීම.
(නම් කිරීමට ලකුණු 02, පැහැදිලි කිරීමට ලකුණු 03 = 05)

(iv) 1. ජනාධිපතිවරණය :- ශ්‍රී ලංකාව එකම ඡන්ද කොට්ඨාසයක් බවට පත් වීම.ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් නියත බහුතරයක් හෙවත් 50% ඉක්මවූ අපේක්ෂකයා ජයග්‍රහණය කිරීම, මෙතෙක් පත්වූ විධායක ජනාධිපතිවරු නම් කිරීම.
2. සමානුපාතික නියෝජන ක්‍රමය :- පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පලාත් සභා මන්ත්‍රීවරු හා පලාත් පාලන ආයතන සඳහා නියෝජිතයන් තෝරා පත් කරගනු ලබන සියළු මැතිවරණ වලදී සමානුපාතික නියෝජන ක්‍රමය යොදා ගැනීම.
ඒ ඒ පක්ෂ ලබා ගත් ඡන්ද සංඛ්‍යාවට අනුපාතිකව පක්ෂයට හිමි ආසන ගණන තීරණය වන අතර අපේක්ෂකයන් ලබා ගත් මනාප ප්‍රමාණය අනුව ඒ ඒ අපේක්ෂකයාට ජයග්‍රහණය හිමි වේ.
3. ජනමත විචාරණය :- ජාතික වැදගත්කමකින් යුත් කරුණක් සම්බන්ධයෙන් සෘජුවම මහජන මතය ලබා ගන්නා ක්‍රමයකි. 1978 ව්‍යවස්ථාව මගින් මුල් වරට ජනමත විචාරණ ක්‍රමය හඳුන්වා දීම
ජනමත විචාරණයට ඉදිරිපත් කෙරෙන කරුණක් ජනතාව විසින් අනුමත කරන ලද බව පිළි ගැනීමට නම් දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 50% ට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත යුතුය.
(නම් කිරීමට ලකුණු 03, පැහැදිලි කිරීමට ලකුණු 03 = 06)

## III කොටස

08. (i) (A) - ස්පාඤ්ඤය, පෘතුගාලය
(B) - මහා බ්‍රිතාන්‍යය / ප්‍රංශය (ලකුණු 1x3 = 03)

(ii) (A) - ජෝර්ජ් වොෂිංටන් (B) - 16 වන ලුවී (xvi ලුවී)
(C) - නැපෝලියන් බොනපාට් (D) - වී.අයි. ලෙනින් (ලකුණු 1x4 = 04)

(iii)
- බූර්බෝන් රාජ වංශයේ ලුවී රජවරුන්ගේ යටතේ ක්‍රියාත්මක වූ දූෂිත පාලනය රජවරුන් අධි සුඛෝපභෝගී ජීවිත ගත කිරීම
- රදළයන් හා නිලධාරීන් අතර ඇති වූ ගැටුමෙන් පාලනයේ ඒකාබද්ධතාව බිඳ වැටීම
- ස්ටේට් ජෙනරල් සභාව අකර්මන්‍ය වීම
- ප්‍රංශ ආණ්ඩුක්‍රමය බිඳ වැටීම (හේතු 02කට ලකුණු 02, විස්තරයට ලකුණු 03 = 05)

(iv)
- ලෙනින්ගේ නායකත්වයෙන් යුතු බෝල්ෂෙවික් වරන් විසින් ආණ්ඩුවක් පිහිටුවීම
- ජර්මනිය සමඟ පැවති යුද්ධය අවසන් කර සාමය උදා කර ගත හැකි වීම
- නව ආණ්ඩුව විසින් පෞද්ගලික ඉඩම් අයිතිය අහෝසි කිරීම
- විශාල සමූහ ගොවිපලවල් පිහිටුවීමට පියවර ගැනීම
- සියළු කර්මාන්තශාලා ජනසතු කිරීම
- කොමියුනිස්ට් පක්ෂයේ මගපෙන්වීම මත සෝවියට් මණ්ඩල වලට පාලන කටයුතු පැවරීම
- රුසියාව, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය නමින් හැඳින්වීම
- සමාජවාදී දර්ශනය පිළිගත් රාජ්‍යයක් වීම

(නම් කිරීමට ලකුණු 03, විස්තරයට ලකුණු 03 = 06)

09. (i) මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය, ඇමෙරිකා එක්සත් ජනපදය, රුසියාව
ජර්මනිය, ඉතාලිය, ජපානය
(ලකුණු 1x3 = 03)

(ii) A - වුඩ්රෝ විල්සන් B - ලොයිඩ් ජෝර්ජ්
C - ක්ලෙමන්ෂෝ D - විටෝරියෝ ඔලැන්ඩෝ (ලකුණු 1x4 = 04)

(iii) ජර්මනියේ නට්සිවාදය
ඉතාලියේ පැසිස්ට්වාදය
ජර්මනියේ ක්‍රියාකලාපය
* අසල්වැසි රාජ්‍ය ආක්‍රමණය කිරීමේ ප්‍රතිපත්තිය.
* හිට්ලර්ගේ යුදෙව් විරෝධී ප්‍රතිපත්තිය
* පිරිසිදු ආර්ය ජාතියක් වූ ජර්මානුවන්ට ලෝක ආධිපත්‍යය හිමිවිය යුතු බවට හිට්ලර් තුළ තිබූ දැඩි ආකල්පය.
* හිට්ලර්ගේ ජාතිමාමකත්වය.
* ප්‍රංශය තනි කිරීමේ ප්‍රතිපත්තිය.

(මතවාද දෙක නම් කිරීමට ලකුණු 02, විස්තර කිරීමට ලකුණු 03 - 05)

(iv)
* යටත් විජිත වලට නිදහස ලැබීම.
* පැරණි අධිරාජ්‍යවාදී රටවල බලය හීන වී යාම. (බ්‍රිතාන්‍ය, ප්‍රංශය)
* ලෝකය බලකඳවුරු දෙකකට බෙදීම.
* ජර්මනිය දෙකඩවීම.
* නව රාජ්‍යයන් බිහිවීම (ඊශ්‍රායලය, යුගෝස්ලෝවියාව)
* එක්සත් ජාතීන්ගේ සංගමය බිහිවීම. (නම් කිරීමට ලකුණු 03, විස්තර කිරීමට ලකුණු 03 - 06)